CLIPPINGS

a collection of newspaper reports on
Sri Lanka Ports Authority

APRIL 2020



CLIPPINGS

පුවත්පත - මව්බිම දිනය - 2020-04-21

හම්බන්තොට තෙල් නැවේ මෙහෙයුම

තිස්සමහාරාම-රෝෂන් රාජිත

හම්බන්තොට වරායට ප්‍රථම වරට සේන්දු වූ ඉන්ධන සැපයුම් නෞකාවකින් ඉන්ධන මෙට්‍රික් ටොන් 25,000ක් මුදාහැරීම සිදුවූ බව එහි ප්‍රධාන මෙහෙයුම් නිලධාරි තිස්ස වික්‍රමසිංහ මහතා 'මව්බිම'ට පැවැසීය.

වරායේ අලුත්වැඩියා කරන ලද තෙල් ගබඩා සංකීර්ණය වෙත මෙම තෙල් මුදාහැර ඇති අතර මේ අනුව සුදුරේදී හම්බන්තොට වරාය නැව් සඳහා ඉන්ධන සැපයීමද ආරම්භ ඇත. එහි තෙල් ගබඩා සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු ලොජිස්ටික් විවිධීකරණ ප්‍රමිතිය අනුව සිදුව ඇති අතර එහි කළමනාකරණය සයිනොපෙක් ඔයිල් සමාගම මඟින් සිදුකරයි.

හම්බන්තොට වරාය බලශක්ති කේන්ද්‍රස්ථානයක් බව ක්‍රියාත්මක වීම සඳහා HIPG සමාගම ලාෆ්ස් ගෑස් සමාගම සමඟ එක්ව එල්.පී.ජී. ගබඩා ප්‍රතිස්ථාපනයට ක්‍රියාකර තිබේ.



පුවත්පත - මව්බිම   දිනය - 2020-04-22

වරායේ සේවක පිරිස 1/4ට බස්සයි

ඩබ්ලිව්.කේ. ප්‍රසාද් මංජු

කොරෝනා වයිරසය රට තුළ මැඩපැවැත්වීමට ගෙන ඇති පියවර හේතුවෙන් කොළඹ වරාය තුළ සාමාන්‍යයෙන් සේවයේ යෙදෙන දසදහසකට ආසන්න සේවක පිරිස දෙදහස්පන්සියය දක්වා මේ වනවිට සීමාකර තිබෙන බවත් මෙම පිරිසෙන් දැනට අත්‍යවශ්‍යම සේවාවන් පමණක් පවත්වාගෙන යනු ලබන බවත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති විශ්‍රාමික ජෙනරාල් දයා රත්නායක මහතා "මව්බිම"ට ප්‍රකාශ කළේය.

දැඩි සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන්ට යටත්ව දැනට සිදුකරනු ලබන්නේ නැව්වලින් භාණ්ඩ ආනයනය සහ අපනයනය පමණක් බවත් කිසිදු ආකාරයකින් මගී නෞකාවල හෝ භාණ්ඩ නෞකාවල සිටින කිසිම පුද්ගලයකුට කුමනාකාරයකට හෝ ශ්‍රී ලංකාවට ඇතුළුවීම තහනම් කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක අංශ මෙන්ම නාවික හමුදාවද දැඩි අවධානයක් යොමුකර තිබෙන බවත් දයා රත්නායක මහතා විසින් පෙන්වා දෙන ලදී.

කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය, ගාල්ල වරායන්වල අත්‍යවශ්‍ය සේවා කටයුතු දැඩි ආරක්ෂිත ක්‍රම අනුව ක්‍රියාත්මක වන බවද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා ප්‍රකාශ කළේය.

වසංගත රෝග අවදානමක් නොමැති අවස්ථාවලදී පවා ශ්‍රී ලංකාවේ ප්‍රධාන වරායන්ට නෞකාවලින් පැමිණෙන පුද්ගලයන් හා භාණ්ඩ ගැන සෞඛ්‍ය අංශ නිරන්තරයෙන් සොයා බැලීම් සිදුකරන බවත් කොරෝනා වයිරස තත්ත්වය හමුවේ එම සෝදිසි කිරීම් හා සොයා බැලීම් වැඩිකර ඇති බවත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

CLIPPINGS

පුවත්පත - දිවයින   දිනය - 2020-04-22

වරාය අධිකාරියත් පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මියගිය අය සහ තුවාල ලැබූවන් සමරයි

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මියගිය අය සහ තුවාල ලැබූවන් සමරා විශේෂ ආගමික උත්සවයක් ඊයේ(21දා) වරාය සභාපති ජෙනරාල් දයා රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් සම්බුද්ධත්ව චෛත්‍යය පරිශ්‍රයේදී පැවැත්විණි. වරාය අධිකාරියේ බෞද්ධ සංගමය උත්සවය සංවිධානය කරන ලදි.එහි අවස්ථාවක් ඡායාරූපයේ දැක්වේ.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමණාකාර අධ්‍යක්ෂ කපිතාන් අතුල හේවාවිතාරණ, අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ උපාලි ද සොයිසා, අධ්‍යක්ෂ (මෙහෙයුම්) ජයන්ත පෙරේරා, අධ්‍යක්ෂ (ආරක්ෂක) මේජර් ජෙනරාල් ගාමිණී හෙට්ටිආරච්චි, අධ්‍යක්ෂ (සේවා සැපයුම්) උපුල් ජයතිස්ස, හාබර් මාස්ටර් නිර්මාල් සිල්වා, ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) එම්.එස්.එස්දේවප්‍රිය යන මහත්ම මහත්මීන් ඇතුළු උසස් නිලධාරීන්ද විධායක නිලධාරීන් ද සේවක මහත්ම මහත්මීන් ඇතුළු විශාල පිරිසක් සහභාගී වූහ.

පුවත්පත - මව්බිම දිනය - 2020-04-23

හම්බන්තොට වරායට ගෑස් නෞකාවක්



ජේ. ඩී. ද සිල්වා

මෙට්‍රික් ටොන් 1600ක් රැගත් "ගෑස්කරේජ්" නමැති ශ්‍රී ලාංකික ගෑස් නෞකාව හම්බන්තොට ජාත්‍යන්තර වරායට පැමිණ ඇත.

හම්බන්තොට ජාත්‍යන්තර වරායට යාබදව පිහිටි ලාෆ්ස් පහසුකම් සපයන ටැංකි සමූහයට අයත් එක් නෞකාවක් වන, "ගෑස්කරේජ්" නෞකාව මඟින් රැගෙන විත් ඇති ගෑස් තොගය එම ටැංකි සමූහයට ගොඩබෑමට නියමිතය.

ලාෆ්ස් මැරිටයිම් සර්විසස් පෞද්ගලික සමාගමට අයත් "ගෑස් කරේජ්" නමැති මෙම නෞකාව හම්බන්තොට ජාත්‍යන්තර වරායේ ලියාපදිංචි කළ පළමු නෞකාව වීම විශේෂත්වයකි.

පුවත්පත - අරුණ   දිනය - 2020-04-23

වරායේ තිබූ කහ කන්ටේනර් මුදා හරී

නයන තරංග ගමගේ

කොළඹ වරායෙන් නිදහස් නොකර රහසිගතව රඳවා තබාගෙන සිටි කහ බහළුම් (කන්ටේනර්) කිහිපයක් මුදාහැරීමට කටයුතු කර තිබේ.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සුබ හීන්කෙන්ද පවසන්නේ මෙම කන්ටේනර් නිදහස් කිරීමෙන් අනතුරුව දැනට රට තුළ පවතින කහ හිඟය ඉදිරි සතිය ඇතුළත මගහැරී යනු ඇති බවයි.

දෙපාර්තමේන්තු වාර්තා සඳහන් කරන ආකාරයට අදාළ කහ කන්ටේනර් පසුගිය ජනවාරි 21 වැනිදයින් පසුව මෙරටට ආනයනය කර ඇත.

මේ අතර පෙරේද දිනයේ රජය විසින් කහ සඳහා රු.750ක පාලන මිලක් නියම කළේය.

පුවත්පත - අරුණ දිනය - 2020-04-23

හම්බන්තොට වරායෙන් වාර්ෂිකව යාත්‍රා 31000කට බනිජ තෙල්

වරුණි පෙරමුණ

හම්බන්තොට වරායේ නාවික සැතපුම් දහයක් දුරින් පිහිටි ප්‍රධාන මුහුදු මාර්ගයේ වාර්ෂිකව ගමන් ගන්නා යාත්‍රා තිස් එක් දහසකට බනිජ තෙල් සැපයීම කඩිනමින් අරඹන බව හම්බන්තොට වරායේ මාධ්‍ය ඒකකය සඳහන් කළේය.

මේ අතර, මෙම වසරේ අප්‍රේල් 22 වැනිද දක්වා කාලයේදී හම්බන්තොට වරායේ වාහන එක්ලක්ෂ විසිහය දහස් හැට හතක් හසුරුවා ඇති බව ද වරාය බලධාරීන් පැවසීය.

කොරෝනා වසංගතය පැවති සමයේදී ද අදාළ මෙහෙයුම් සහ ප්‍රති නැව්ගත කිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකර තිබේ.

CLIPPINGS

පුවත්පත - දිවයින   දිනය - 2020-04-23

ගෑස් කරේජ් නෞකාව හම්බන්තොට වරායට

ලාෆ්ස් මැරිටයිම් සර්විසස් (පුද්) සමාගමට අයත් ,ගෑස් කරේජ්, නැමැති, ශ්‍රී ලාංකික ගෑස් නෞකාව, මෙට්‍රික් ටොන් 1800ක එල්පී ගෑස් පැටවීම සඳහා, පසුගියදා හම්බන්තොට ජාත්‍යන්තර වරායේ නැංගුරම්ලෑ අයුරු

පුවත්පත - දිවයින   දිනය - 2020-04-28

වාහන 6,500 කින් නිදහස් කර ගෙන ඇත්තේ දහසයි

ආනයනය කළ වාහන කඩිනමින් ඉවත් කර ගන්නැයි හම්බන්තොට වරායෙන් ආනයනකරුවන්ට දැනුම් දෙයි

ශ්‍යාම් නුවන් ගනේවත්ත

තමන් ආනයනය කළ වාහන කඩිනමින් ඉවත් කර ගන්න ලෙස හම්බන්තොට වරාය ආනයනකරුවන්ට දැනුම් දෙයි.

අත්‍යවශ්‍ය සේවාවන් සඳහා වරාය පැහැදිලිව පැවතිය යුතු බවට රජයේ නියෝගය අනුව ඉදිරි දින කිහිපය තුළ වාහන පන්දහසක් පමණ වරායෙන් පිටතට ගෙන යාමට හම්බන්තොට ජාත්‍යන්තර වරාය තීරණය කර තිබේ.

"ආනයනය කරන ලද වාහන 6,500 කින් මේ වන විට නිදහස් කර ගෙන ඇත්තේ දහසක පමණ බවද වාර්තා වේ.

මේ වාහන නිෂ්කාශනය කඩිනම් කිරීම සඳහා අපට ආනයනකරුවන්ගේ පූර්ණ සහයෝගය අවශ්‍ය වෙන බව හම්බන්තොට ජාත්‍යන්තර වරායෙහි හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තිස්ස වික්‍රමසිංහ මහතා මාධ්‍යට පැවසීය.

වරායක් ලෙස අපි පැය 24 පුරා ක්‍රියාත්මක වන අතර මෙම මාසය අවසන් වන විට වාහන ඉවත් කිරීමට අපට හැකි වේ යැයි අපි බලාපොරොත්තු වෙන බවද ඔහු කීවේය.

නිෂ්කාශනය සඳහා පහසුකම් සැපයීම සඳහා අදාළ සියලුම රජයේ දෙපාර්තමේන්තු ක්‍රියාත්මක වන බවට බලධාරීන් සහතික වී තිබෙනවා.

මේ අතර 2020 මාර්තු 16 සිට 2020 අප්‍රේල් 30 දක්වා වූ කාලය සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීම ඉවත් කර තිබෙනවා. කෙසේ වෙතත් නිෂ්කාශනය ක්‍රියාවලිය කඩිනම් කිරීමට සහාය නොදක්වන ආනයනකරුවන් සඳහා මෙම සහනය කිසිසේත් දීර්ඝ නොකරන බව ද තිස්ස වික්‍රමසිංහ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

Newspaper – Daily FT   Date – 28-04-2020

SLPA to incur overall revenue drop of Rs. 2.5 b in April

THE Sri Lanka Ports Authority (SLPA) yesterday predicted a Rs. 2.5 billion or 50% drop in its overall in revenue this month given the COVID-19 pandemic.

"Considering the current situation, we are expecting a 50% drop in our overall revenue this month compared to last year, which is about Rs. 2.5 billion," SLPA Chairman General Daya Ratnayake told Daily FT.

He also said that the TEUs handled at Colombo Port dropped 22% year-to-date. Regardless of the downward situation, the number of vessels calling at the port has increased by 2.2% during the first four months.

The Chairman said the targets previously outlined would be revised in the coming months.

As shipping was announced as an essential service during the ongoing COVID-19 crisis, almost all personnel at the SLPA were called for work it resulted in an additional cost in providing transport during curfew, food, sterilisation of the premises and health gear.

More Page 6

Singapore's PSA, container freight operators warn of congestion at Indian ports

NEW DELHI/CHENNAI (Reuters): Singapore's PSA International and Indian container freight operators have warned the Indian Government that its order to waive container storage charges during the coronavirus lockdown could lead to port congestion, letters seen by Reuters showed.

India's Ministry of Shipping asked ports to allow free storage of containers as part of relief measures to ease pressure on companies hit by logistics restrictions because of India's nationwide lockdown.

More Page 6

SLPA to...

"The COVID-19 pandemic has really put almost all economies navigating in uncharted waters, but amidst the challenges we at SLPA are managing to stay afloat," Ratnayake added.

Noting that there had been some issues with storage with both Colombo and Hambantota reaching full capacities, Ratnayake said all concerned stakeholders had now been informed to provide necessary arrangements to clear the goods from the ports.

"We understand that it is a difficult to clear the goods with limitations on mobility in the country. Thereby, we have now made arrangements with the relevant authorities and financial institutions to assist the importers in clearing the containers and vehicles that are stuck at port premises," he added.

Whilst most of the importers had adhered to clearing their goods, he said LC cargo importers' response had not been adequate given the situation.

Ratnayake also commended the support extended by Sri Lanka Customs Department in clearing out the cargo. Accordingly, with minor staff the department has been able to clear around 1,500 containers on a daily basis, which is almost 80% to 90% of its capacity on a regular day.

The Chairman called on for self-discipline, right attitude and tolerance during these difficult times, as business and work processes may not function as usual. "Everyone needs to corporate to overcome the difficulties we are faced with. It is not limited to a particular sector or person; we all are in this together. Those at public and private institutions are also working beyond the normal risk factors and therefore the tolerance levels and right mindset will allow us in a win-win situation," he pointed out.

CLIPPINGS

පුවත්පත - ලංකාදීප දිනය - 2020-04-28

'ගෑස් කරේජ්' හම්බන්තොට වරායට

ලාෆ්ස් මැරිටයිම් සර්විසස් (පුද්) සමාගමට අයත් 'ගෑස් කරේජ්' (Gas Courage) නැමැති, ශ්‍රී ලාංකික ගෑස් නෞකාව, මෙට්‍රික් ටොන් 1800ක L.P.G. ගෑස් ගොඩ බෑම සඳහා පසුගියදා හම්බන්තොට ජාත්‍යන්තර වරායේ නැංගුරම් ලෑවේය.

හම්බන්තොට ජාත්‍යන්තර වරායේ ලියාපදිංචි කළ පළමු නැව වන්නේ ද 'ගෑස් කරේජ්' නෞකාවයි.

ටොන් 2998 ක සමස්ත පරිමාවක් සහ උපරිම මීටර් 5.5 ක අවම ජල ගැඹුරක් ඇති 'ගෑස් කරේජ්' හම්බන්තොට ජාත්‍යන්තර වරායට යාබදව පිහිටි ලාෆ්ස් ගබඩා පහසුකම් සපයන ටැංකි සමූහයට අයත් එක් නෞකාවකි.

Newspaper – Daily FT   Date – 29-04-2020

SLPA extends occupancy charge waiver till 7 May

ON top of the demurrage free period, Sri Lanka Ports Authority (SLPA) has extended the occupancy charges till 7 May for all ports, as a relief measure to the import trade and shipping community.

To ensure continuous operation at all ports SLPA has instructed SAGT and CICT to offer related concession from 14 April to 7 May to all consignees.

Only basic occupational rent will be charged at terminals for all imported local TEUs. The terminals of JCT and UCT of SLPA, terminals of the SAGT and CICT will act accordingly.

Previously, occupancy charges were waived-off treating as holidays in the system from 7 March to 14 April.

More Page 2

SLPA...

Occupancy charges are the rent collected by the SLPA for keeping containers and cargo inside the port.

With the outbreak of COVID-19 in the island, institutions related to operating import and export consignments faced many difficulties with limited access to mobility. As a result, all terminals and warehouses such as SAGT and CICT reached their maximum capacities. This has further created obstacles for the continuity of port operations and space required for positioning of containers and cargo at terminals and warehouses within the port.

Occupancy charges waiver was given as a relief measure to companies due to the COVID-19 pandemic.

"Given this difficult period we extended our fullest cooperation to all the stakeholders. However, going forward from 8 May, there is no room for us to provide such concessions and the penal duties will be charged," SLPA Chairman Major General Daya Ratnayake told the Daily FT.

The economic cost of the decision is yet to be assessed, he said. (CdeS)

CLIPPINGS

Newspaper – Daily FT   Date – 29-04-2020

Imported vehicles in the yard at Hambantota International Port

H'tota Port concerned by slow vehicle clearance

- **Over 5,700 vehicles to be cleared before 30 April deadline**

THE clearance of cars at the Hambantota Port is slow, and the port is concerned they will not meet the 30 April deadline for clearing imported vehicles.

"No vehicles were cleared over the weekend, and the number cleared on Monday was 203 while port dues have been paid for 425 chassis, which we hope would leave the port soon. We cannot understand why they are not clearing the vehicles on time, as the demurrage waiver period is ending soon," said Hambantota International Port Group (HIPG) COO Tissa Wickremasinghe.

Port officials say that clearance applications received yesterday were for only 220 chassis, and 5,755 vehicles are still lying in their yard awaiting clearance.

More Page 2

Continuation from page 01

H'tota...

The port had previously informed vehicle importers that demurrage costs incurred from 16 March to 30 April 2020 will be waived off. They also communicated instructions by the Sri Lanka Police and HIP on cargo clearance procedures to wharf clerks and vehicle importers associations to ensure their health and safety, as well as the health and safety of the people who live near the port.

The Hambantota Wharf Clerks Association has acknowledged the measures taken by HIP by letter, placing on record their appreciation of the entire staff of the port, for the safety measures taken in the pandemic's midst, and for the understanding and support extended by the port, especially where operational matters were concerned.

Hambantota International Port (HIP) officials reiterate that all facilities are working round the clock to speed up clearance, including Sri Lanka Customs who are open for business even on weekends. HIP's document centre is also operational and HIP has enabled shipping lines to carry out online payments and transfers for stevedoring and navigational bills and also plans to implement online payment for customers who clear the vehicles at HIPG. The e-DO facility for customers will commence on 1 May to quicken the clearance process, making it more convenient and minimise human interactions.

CLIPPINGS

පුවත්පත - දිනමිණ දිනය - 2020-04-29

වරාය අංගණ කුලී හා ගුදම් ගාස්තු සහන කාලය මැයි 7වැනිදා තෙක්

නුවන් කොඩිකාර

වරාය අංගණ කුලී හා ගුදම් ගාස්තු සඳහා වන සහන කාල සීමාව මැයි මස 07 වැනිද දක්වා දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

ඒ අනුව කොළඹ වරාය ඇතුළු ශ්‍රී ලංකාවේ සියලු වාණිජ වරායන්හි අංගණ කුලී හා ගුදම් ගාස්තු සඳහා වන සහන කාල සීමාව දීර්ඝ කළ බවත් එහි වාසිය වරාය ආශ්‍රිත භාණ්ඩ ආනයනකරුවන්ට ලබාදෙන ලෙස වරාය හා නාවික අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය, SAGT පර්යන්ත සමාගම හා CICT පර්යන්ත සමාගම යන ආයතන වෙත දැනුම් දී ඇත.

අප්‍රේල් මස 14 වැනි දින සිට මැයි 07 දක්වා කාල සීමාව සඳහා පර්යන්තයන්හිදී ගෙවිය යුතු, ආනයනික දේශීය බහලු සඳහා වන මූලික අංගණ හා කුලී ගාස්තු පමණක් අය කරන අතර, එම කාලය සඳහා වන දණ්ඩන කුලී ගාස්තුවලින් සම්පූර්ණයෙන් නිදහස් කරන බව වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය පවසයි.

වරාය හා නාවික කටයුතු ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ උපදෙස් පරිදි මේ තීරණය ගෙන තිබේ.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ආනයනික හා අපනයනික භාණ්ඩ මෙහෙයවීම සඳහා ඒ ආශ්‍රිත සමාගම් හා එම කාර්ය මණ්ඩලවලට විශාල දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුව ඇත. එම හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත හා ගුදම්, SAGT පර්යන්ත සමාගම හා CICT පර්යන්තයන් තීද ගැනීමේ උපරිම ධාරිතාව උපරිමය දක්වා පැමිණ ඇත. එය වරාය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමටත් බහාලුම් හා නැව් භාණ්ඩ ස්ථානගත කිරීම සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ලබාගැනීමටත් අදාළ පර්යන්තයන්ට හා ගුදම්වලට ගැටලුවක් ඇත.

රට තුළ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ හා බෙහෙත් ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් අවශ්‍ය භාණ්ඩ ආනයනය හා බෙදාහැරීම වෙනුවෙන් ද වරාය සේවා අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. මේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකර ගෙන යාමටත් රට තුළ ක්‍රමානුකූලව ආරම්භ කෙරෙන කර්මාන්ත ශාලා හා ආයෝජන කලාපවලට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමටත් වරාය මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුවීම නිසා මේ තීරණයට එළඹ තිබේ.

Newspaper – Daily News Date – 29-04-2020

Clearing of Vehicles from Hambantota Port slow

The clearance of cars at the Hambantota Port is slow, and the port is concerned that they would not meet the April 30th deadline for clearing imported vehicles.

"No vehicles were cleared over the weekend, and the number cleared on Monday was 203 while port dues have been paid for 425 chassis, which we hope would leave the port soon. We cannot understand why they are not clearing the vehicles on time, as the demurrage waiver period is ending soon," says Tissa Wickremasinghe, COO, HIPG.

Port officials say that clearance applications received today are for only 220 chassis, and 5,755 vehicles are still lying in their yard awaiting clearance.

The port had previously informed vehicle importers that demurrage costs incurred from the 16 March 2020 to the 30 April 2020 will be waived off. They also communicated instructions by the Sri Lanka Police and HIP on cargo clearance procedures to wharf clerks and vehicle importers associations to ensure their health and safety, as well as the health and safety of the people who live near the port.

The Hambantota Wharf Clerks Association has acknowledged the measures taken by HIP by letter, placing on record their appreciation of the entire staff of the port, for the safety measures taken in the pandemic's midst, and for the understanding and support extended by the port, especially where operational matters were concerned.

HIP officials reiterate that all facilities are working round the clock to speed up clearance, including Sri Lanka Customs who are open for business even on weekends. HIP's document center is also operational and HIP has enabled shipping lines to carry out online payments and transfers for stevedoring and navigational bills and also plans to implement online payment for customers who clear the vehicles at HIPG. e-DO facility for customers will commence on May 1, to quicken the clearance process, making it more convenient and minimize human interactions.

Newspaper – Daily Mirror Date – 29-04-2020

Vehicle clearing at Hambantota Port slow

- 5,755 vehicles still lying in port yard awaiting clearance
- Demurrage waiver period set to expire on April 30

The clearance of cars at the Hambantota Port is slow, and the port is concerned that they would not meet the April 30th deadline for clearing imported vehicles.

"No vehicles were cleared over the weekend, and the number cleared on Monday was 203 while port dues have been paid for 425 chassis, which we hope would leave the port soon. "We cannot understand why they are not clearing the vehicles on time, as the demurrage waiver period is to end soon," said Tissa Wickremasinghe, COO, HIPG.

Port officials said that clearance applications received yesterday were only for 220 chassis, and 5,755 vehicles are still lying in their yard awaiting clearance.

The port had previously informed vehicle importers that demurrage costs incurred from March 16, 2020 to the April 30 2020 will be waived off.

MORE ON P13

Vehicle clearing..

They also communicated instructions by the Sri Lanka Police and HIP on cargo clearance procedures to wharf clerks and vehicle importers associations to ensure both their health and safety, as well as the health and safety of the people who live near the port.

The Hambantota Wharf Clerks Association has acknowledged by letter the measures taken by HIP, placing on record their appreciation of the entire staff of the port, for the safety measures taken in the midst of the pandemic, and for the understanding and support extended by the port, especially where operational matters were concerned.

HIP officials reiterate that all facilities are working round the clock to speed up clearance, including Sri Lanka Customs who are open for business even on weekends.

HIP's document center is also operational and HIP has enabled shipping lines to carry out online payments and transfers for stevedoring and navigational bills and also plans to implement online payment for customers who clear the vehicles at HIPG.

e-DO facility for customers will commence on May 1 to quicken the clearance process, making it more convenient and to minimize human interactions.

පුවත්පත - ලංකාදීප   දිනය - 2020-04-29

වරායවල ගුදම් ගාස්තු සහන කාලය දික්කරයි

(රංජන් කස්තූරි)

කොළඹ වරාය සහ අනෙකුත් සියලු වරායවල අංගන කුලී හා ගුදම් ගාස්තු ගෙවීම සඳහා ලබාදී තිබූ සහන කාලය මැයි මැයි 27 වැනි දින දක්වා දීර්ඝ කළ බව වරාය හා නාවික අමාත්‍යාංශය සඳහන් කරයි.

රටේ පවතින තත්ත්වය හේතුවෙන් ආනයනික හා අපනයනික භාණ්ඩ මෙහෙයවීම සඳහා ඒ ආශ්‍රිත සමාගම් හා කාර්ය මණ්ඩලවලට විශාල දුෂ්කරතාවන්ට මුහුණපෑමට සිදුව තිබෙන බවද එම හේතුවෙන් මෙම තීරණයක් බවද එම අමාත්‍යාංශය කියයි.

CLIPPINGS

පුවත්පත - අරුණ දිනය - 2020-04-29

වරායේ මේ මස ආදායම හරි අඩකින් පහළට

නයන තරංග ගමගේ

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙම මස ආදායම පෙර වසරවල අප්‍රේල් මාසයේ ආදායමට වඩා සියයට පනහකින් නොහොත් රුපියල් බිලියන 2.5කින් පහත වැටෙනු ඇතැයි වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගත්විට අපේක්ෂා කරන බව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති විශ්‍රාමික ජෙනරාල් දයා රත්නායක පවසයි. 02 පිටුවට

වරායේ මේ මස ආදායම...

මේ අතර කොළඹ වරායේ බහලුම් (කන්ටේනර්) මෙහෙයුම් කටයුතු 22%කින් පහත වැටී ඇති බවද පවසන සභාපතිවරයා එසේ වුවද 2020 පළමු මාස 04ක කාලය තුළ වරායට සේන්දු වී ඇති නෞකා සංඛ්‍යාව 2.2කින් ඉහළ ගොස් ඇති බවද පැවසීය.

කෙසේ වෙතත් දැනට සකස්කර ඇති වරාය අධිකාරියේ ඉලක්ක ඉදිරි මාසවලදී සංශෝධනය කරන බවද හෙතෙම සඳහන් කරයි.

පවත්නා කොවිඩ් -19 අර්බුදය හමුවේ වරාය මෙහෙයුම් අත්‍යවශ්‍ය සේවාවක් බවට පත්කර ඇති හෙයින් වරාය අධිකාරියේ සියලුම සේවකයන් සේවය සඳහා කැඳවා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අතිකාල, ආහාර, විෂබීජහරණය සහ සෞඛ්‍ය හා ප්‍රවාහන වියදම් අතිරේකව දැරීමට සිදුව ඇති බැවින් අධිකාරියට අතිරේක පිරිවැයක් දැරීමට සිදුව ඇත.

මේ අතර කොළඹ සහ හම්බන්තොට යන වරායන් දෙකම පූර්ණ ධාරිතාවට ළඟාවී ඇති හෙයින් ඒවායේ යම් යම් ගැටලු ඇතිවී තිබෙන බව සඳහන් කරන සභාපතිවරයා වරායවලින් භාණ්ඩ ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙස අදාළ සියලු පාර්ශ්වකරුවන්ට දැනුම් දී ඇතැයිද සඳහන් කරයි.

පුවත්පත - අරුණ දිනය - 2020-04-29

වරායේ කුලී හා ගුදම් ගාස්තු සහනය මැයි 7 දක්වා දීර්ඝ වේ

කොළඹ වරාය ඇතුළු ශ්‍රී ලංකාවේ සියලු වාණිජ වරායන්හි අංගණ කුලී හා ගුදම් ගාස්තු සඳහා වන සහන කාල සීමාව එළැඹෙන මැයි මස 7 වැනිදා දක්වා දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය 'SAGT' පර්යන්ත සමාගමට සහ 'CICT' පර්යන්ත සමාගමට දැනුම් දී ඇත.

රටේ පවත්නා වසංගත තත්ත්වය හේතුවෙන් ආනයනික හා අපනයනික භාණ්ඩ මෙහෙයවීමේදී ඒ ආශ්‍රිත සමාගම් හා කාර්ය මණ්ඩලවලට දුෂ්කරතාවන්ට මුහුණ පෑමට සිදුව තිබේ.

ඒ හේතුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත හා ගුදම් හිදි SAGT හා CICT පර්යන්තවල රඳවා ගැනීමේ ධාරිතාව උපරිමයට පැමිණ තිබේ.

එම වරාය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමටත් බහාලුම් හා නැව් භාණ්ඩ නැවත ස්ථානගත කිරීම සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ලබාගැනීමටත් අදාළ පර්යන්තයන්ට හා ගුදම්වලට ගැටලුවක් වී ඇති බව වරාය අධිකාරිය නිවේදනය කරයි.

එම නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරමින් මාර්තු මස 16 වැනි දින සිට 2020 අප්‍රේල් 13 වැනිදා දක්වා ලබාදුන් වරාය අංගණ හා කුලී ගාස්තු පිළිබඳ නියෝග දීර්ඝකර ඇත.

ඒ අනුව අදාළ සහනය අප්‍රේල් මස 14 වැනි දින සිට මැයි මස 7 වැනි දින දක්වා වරාය ආශ්‍රිත භාණ්ඩ ආනයනකරුවන්ට ලබාදීමට වරාය අධිකාරිය අදාළ සමාගම්වලට උපදෙස් දී තිබේ.

අදාළ කාල සීමාව සඳහා පර්යන්තයන්හිදී ගෙවිය යුතු ආනයනික දේශීය බහාලුම් සඳහා වන මූලික අංගණ හා කුලී ගාස්තු පමණක් අය කරන අතර උක්ත කාලය සඳහා වන දණ්ඩන කුලී ගාස්තුවලින් සම්පූර්ණයෙන්ම නිදහස් කෙරෙයි.

නැව් සමාගම්වලට ප්‍රමාද ගාස්තු සහනය මැයි 7 දක්වා

■ නයනා තරංගා ගමගේ

ආනයන වෙළෙඳ සමාගම් සහ නෞකා සමාගම්වලට කොළඹ වරාය මගින් ලබා දී ඇති ප්‍රමාද ගාස්තු රහිතව මෙහෙයුම් සිදු කිරීමේ කාලය 2020 මැයි 07 වැනි ද දක්වා දීර්ඝ කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති මේජර් ජෙනරාල් දයාරත්නායක පවසන්නේ නෞකා කර්මාන්තය සඳහා රජය දක්වන සුහදශීලීත්වය මත මෙම තීරණය ගනු ලැබූ බවයි.

අඛණ්ඩ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා වරාය අධිකාරිය විසින් මෙම ප්‍රමාද ගාස්තු නිදහස් කිරීමේ සහනය ක්‍රියාත්මක කරන ලද්දේ පසුගිය අප්‍රේල් 14 වැනිදය. ඒ කොවිඩ්-19 වෛරසය මෙරට ව්‍යාප්ති වීම හමුවේ වරාය මෙහෙයුම් කටයුතුවලට ද බාධා පැමිණීම හේතුවෙන් නෞකා සමාගම් හා ආනයනකරුවන් අසීරුතාවට පත්වීම සලකා බලමිනි.

කෙසේ වෙතත් මේ වන විටත් කොළඹ වරායේ ගබඩා ධාරිතාවෙන් 90%ක්ම සම්පූර්ණ වී ඇති බැවින් මෙම සහනය මැයි 07 වැනිදයින් පසු පර්යන්ත 03වම ලබා දිය නොහැකි බව සභාපතිවරයා පවසයි. කොළඹ වරායේ පර්යන්ත තුනේම සම්පූර්ණ ධාරිතාව බහාළුම් (කන්ටේනර්) එක්ලක්ෂ තිස් හත් දහසක් (137000) පමණ වේ.

CLIPPINGS

Newspaper – Daily FT   Date – 30-04-2020

SLPA eyes luring COVID-19-hit ships to anchor in SL ports

- Anchorage facilities being mulled by SLPA for vessels
- Confident of earning much needed forex
- SLPA predicts Rs. 2.5 b drop in revenue this month

SLPA Chairman Maj. Gen. Daya Ratnayake

By Charumini de Silva

WITH regional ports closed, the Sri Lanka Ports Authority (SLPA), as part of new business development, is planning to encourage berthing of ships. More Page 2

SLPA ...

"We are considering on venturing into anchorage facilities for the vessels that are in the sea due to the closure of ports in the region," SLPA Chairman Maj. Gen. Daya Ratnayake told the Daily FT.

He said it was important to think smart and look how challenges can also be converted into new opportunities.

"Currently there are many vessels in the surrounding sea, which is actually very costly for the shipping lines. These cargo vessels thereby can be facilitated at Port of Colombo for anchorage. Allowing such business at this point is critical to earn foreign exchange given the difficulties the entire world is faced with," he said.

Ratnayake said the SLPA is constantly looking at short, medium and long-term revival strategies to ensure that the institution remains a key contributor to the economy.

"Coronavirus has caused demand to fall lower and remain at lower levels for much longer than in a usual year. Therefore, looking at new businesses opportunities is critical at this point," he added. The Chairman said SLPA predicts Rs. 2.5 billion or 50% drop in its overall revenue this month due to the COVID-19 pandemic.

He noted that once the cargo that is currently being cleared at port premises will also allow more space and facilities for new business opportunities.

"A recovery also could be in the cards for the container sector, with the weekly number of large containership journeys originating in China now going back up. Now many sectors are showing recent recoveries in demand, which should lead to improvements in the markets," he said.

However, he said the situation developing daily is so critical to keep a careful and regular eye on the evolving demand data.

"We need to make sure that local ports and terminals are kept open for business. By saying that we recognise that naturally there is a global need for containing the spread and we need to deal with it in a sensible manner in order to make sure that food and goods are kept flowing to where it is needed because that is basically where shipping lands a lifeline to the global public," Ratnayake stressed.

පුවත්පත - අරුණ දිනය - 2020-04-30

වරායේ භාණ්ඩ නිෂ්කාශන ගෙවීම් අන්තර්ජාලයෙන්

■ වරුණි පෙරමුණ

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලියට අදාළ සියලු ගෙවීම් මැයි 4 වැනිද සිට අන්තර්ජාලය මගින් සිදුකරන බව වරාය අධිකාරියේ සහකාර කළමනාකාර අධ්‍යක්ෂ උපාලි සොයිසා පැවසීය. භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලියේදී නැව් නියෝජිත සමාගම්වලට සහ අනෙකුත් පර්යන්ත සමාගම්වලට සිදුකරන ගෙවීම් සහ ලියකියවිලි හුවමාරු කිරීම් මෙලෙස අන්තර්ජාලය ඔස්සේ සිදු කරන බව ඔහු සඳහන් කළේය.

පුවත්පත - මව්බිම   දිනය - 2020-04-30

හම්බන්තොට වරායේ හිරවුණු වාහන මුදාහරින සහන කාලය අදින් අවසන්

ජේ.ටී. ද සිල්වා

හම්බන්තොට වරාය තුළ ගොඩබා ඇති වාහන සඳහා ප්‍රමාදවීමේ ගාස්තු අය නොකිරීමට ලබාදී ඇති සහන කාලය අදින් (30දා) අවසන් වෙයි.

එම කාලය තුමන හේතුවක් නිසා හෝ දීර්ඝ නොකරන බැවින්, නිෂ්කාශන ක්‍රියාවලිය කඩිනම් කිරීමට සහාය නොදක්වන පිරිස් හට පාඩු විඳීමට සිදුවන බව ඉන්ටර්නැෂනල් පෝර්ට් ගෲප් සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තිස්ස වික්‍රමසිංහ සඳහන් කරයි.

CLIPPINGS

Communication and Public Relations Division

Sri Lanka Ports Authority

No 19, Chaithya Road,

Colombo 01

Sri Lanka

for more details: news.slpa.lk